# හමුදා නියෝග

සමස්ථ යුධ හමුදාවේම පරිපාලනය විධිමත්ව ඒකාකාරී ස්වභාවයෙන් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා නියෝග අවශ්‍ය වේ. එම නියෝගයන් පදනම් කරගෙන සමස්ථ යුධ හමුදාවේම මූලස්ථාන, ආයතන සහ ඒකක තම තමන්ගේ පාලන කටයුතු මනා පැවැත්මකින් හා ස්ථිර පදනමකින් පවත්වාගෙන යනු ලැබේ.

මෙවැනි පැහැදිලි උපදෙස් හා නියෝග නොමැතිව යුධ හමුදාවේ සියලුම උසස් මූලස්ථාන, රෙජිමේන්තු මධ්‍යස්ථාන, ඒකක හා පුහුණු මධ්‍යස්ථාන වල ඇති විවිධ රාජකාරි ඉටු කිරීමට අපහසු හෙයින් ඒ සියලුම කරුණු පිළිබඳව විස්තරාත්මකව සහ පැහැදිලි නියෝග අවශ්‍ය වේ. විශේෂයෙන්ම මේ පිළිබඳව යුධ හමුදා මූලස්ථානය මගින් නිකුත් කරනු ලබන හමුදා නියෝගයන් පහත දක්වා ඇති අයුරු කොටස් 03 කින් සමන්විත වේ.

1. හමුදා නියෝග පාලන
2. හමුදා චරියා නියෝග
3. විශේෂ හමුදා නියෝග

1. හමුදා නියෝග පාලන ඃ

මෙම නියෝග මගින් සමස්ථ යුධ හමුදාව තුළ ප්‍රගුණ කල පාලන ප්‍රතිපත්තීන් සහ ක්‍රියා පිලිවෙත් හා ක්‍රියා මාර්ගයන් නියම කොට නිවැරදිව දක්වා ඇත. එම නියෝග යටතේ පහත සඳහන් කරුණු පිළිබඳව වෙන් වෙන් වශයෙන් වරින් වර හමුදා නියෝග පාලන නිකුත් කරනු ලැබේ.

අ. ප්‍ර කරුණු
ආ. පා කරුණු
ඇ. භකාස කරුණු
ඈ. නීති කරුණු

මේ අයුරින් ඒ ඒ අංශයන් වෙතින් අදාල රාජකාරි ඉටු කිරීමේදී පිලිපැදිය යුතු ක්‍රියාමාර්ග යුධ හමුදා නියෝග මාලාවට ඇතුලත් කොට පලකරනු ලැබේ. එම නියෝග මගින් ඉහත දක්වන ලද කරුණු පිළිබඳව ක්‍රියාත්මක කල යුතු නීතිරීති, ක්‍රියා පිලිවෙත් පැහැදිලි වශයෙන් ස්ථිර කරනු ලැබේ.

මේ අනුව ඉහත සඳහන් කරුණු පිළිබඳව පහත දක්වා ඇති අයුරු හමුදා නියෝග පාලන පලකරනු ලැබේ.

අ. ප්‍ර කරුණු

අවි ආයුධ, පතුරොම් සහ වෙඩිද්‍රව්‍ය, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි හා පුහුණුවීම් ආදී කරුණු පිළිබඳව "ප්‍ර කරුණු" යටතේ හමුදා නියෝග පාලන නිකුත් කරනු ලැබේ.

ආ. පා කරුණු

නිළධාරි/සෙසුනිළයින්ගේ පරිපාලන කටයුතු එනම්, බඳවා ගැනීම්, උසස් කිරීම්, පත්කිරීම් ආදී කරුණු පිළිබඳවත් යුධ හමුදාව තුළ හා යුධ හමුදාව මගින් සිදුකරන උත්සව හා පෙළපාලි පා කරුණු යටතේ හමුදා නියෝග පාලන පලකරනු ලැබේ.

ඇ. භකාස කරුණු

යුධ හමුදාවේ සියලුම නිළධාරි/සෙසුනිළයින්ගේ භකාස කටයුතු එනම්, ආහාරපාන, ඉඳුම් හිටුම්, ඇඳුම් පැළඳුම් ආදිය පිළිබඳව භකාස කරුනු යටතේ හමුදා නියෝග පාලන පලකරනු ලැබේ.

ඇ. නීති කරුණු

යුධ හමුදාවේ ක්‍රියාත්මක වන නීතිමය කරුණු එනම්, යුද්ධාධිකරණ, මූලික පරීක්ෂණ උසාවි (මුපඋ), ලසුනඩු විභාගයන් සහ සියලුම හමුදා අයවලුන්ගේ විනය අදාල කරුණු පිළිබඳව නීතිමය වශයෙන් පලකරනු ලබන නියෝග හමුදා නියෝග පාලන යටතේ නිකුත් කරනු ලැබේ.

2. හමුදා චරියා නියෝග

යුධ හමුදාව තුල දැනට ක්‍රියාත්මක වන විශේෂයෙන්ම මාණ්ඩලික රාජකාරින් සහ පරිපාලන රාජකාරින් පිළිබඳවත්, ඒවා ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම පිළිබඳවත් උපදෙස් හා රෙගුලාසි හමුදා චරියා නියෝග යටතේ පලකරනු ලැබේ. තවද මෙම මාණ්ඩලික රාජකාරින් සහ පරිපාලන රාජකාරින් පිළිබඳව කාලිනව සිදුකරනු ලබන සංශෝධනයන් පලකරනු ලබන්නේද හමුදා චරියා නියෝග මගිනි. මීට අමතරව යුධ හමුදාව තුල මණ්ඩල පත්කිරීම, නිළධාරින්ගේ පත්කිරීම්, නිළධාරින්ගේ විභාග ප්‍රථිඵල, යුධ හමුදාවේ ආයතන හා ඒකක නගා සිටුවීම, ඒවා අහෝසි කිරීම, විනය බලතල පැවරීම ආදි කරුණු හමුදා චරියා නියෝග මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

3. විශේෂ හමුදා නියෝග

යුධ හමුදාපතිතුමන් විසින් සමස්ථ යුධ හමුදාවටම දැනුම් දිය යුතු පණිවුඩයක් පලකරනු ලබන්නේ විශේෂ හමුදා නියෝග යටතේය. ඒ අනුව එතුමන් විසින් ප්‍රකාශයට පත්කරනු ලබන සියලුම ජාතික හා ආගමික උත්සව පණිවුඩ, සුභාෂිංශණ මේ යටතේ පලකරනු ලැබේ.

අනෙකුත් නියෝග

ඉහත දක්වන ලද නියෝගවලට අමතරව වැහාලේඅම සහ ඒකක, කණ්ඩායම්/බළසණ/බතරොයි වෙතින් දෛනිකව පරිපාලන කටයුතු සඳහා පලකරනු ලබන නියෝගයන් පහත දක්වා ඇති පරිදි වේ.

1. ස්ථාවර නියෝග
2. පළවන කොටසේ නියෝග
3. නියෝග දෙවන කොටස

1. ස්ථාවර නියෝග

සමස්ථ යුධ හමුදාවේම නිළධාරින්ට, සෙසුනිළයින්ට සහ ආයතනයන්ට තම රාජකාරි ස්වභාවය සහ වෘත්තිය අනුව නියැලීමත්, ඒවා ඉටු කිරීම පැහැදිලි කිරීම සඳහා ස්ථාවර නියෝග පලකර ඇත. ඒ පිළිබඳව සෑම අංශයක්ම දැනුවත් විය යුතුයි. විශේෂයෙන්ම ඒකක අණදෙන නිළධාරි විසින් තම ඒකකයේ දෙවන අණදෙන නිළධාරි, විධායක අධිකාරි, කණ්ඩායම්/බලසණ/බතරොයි භාර නිළධාරි අණදෙනවරුන් සහ සහකාර භඨකාර්යය සම්පාදක නිළධාරින්, රෙජිමේන්තු සැරයන් මේජර්, රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් මේජර් ආදි සියලුම පත්කිරීම්වල රාජකාරි කිරීම පිළිබඳ ස්ථාවර නියෝග පලකර ඇත.

එම රාජකාරින් ඉටුකිරීම පිළිබඳවත් උපදෙස් ස්ථාවර නියෝගවල පැහැදිලිව දක්විය යුතුය. මෙම නියෝගයන් නොමැතිව යුධ හමුදාවේ සියලුම ආයතන/ඒකක පරිපාලන කටයුතු සිදුකිරීම අපහසුවන අතර, සියලුම නිළයින්ගේ විනය උසස් මට්ටමකින් පවත්වාගෙන යාම පිළිබඳවත් ගැටළු ඇතිවිය හැක. යුධ හමුදා ආයතන සහ ඒකකයන් තුල කුමන හෝ පත්කිරිමක් පත්කල වහාම ඊට අදාල ස්ථාවර නියෝග පලකල යුතු අතර, එම ස්ථාවර නියෝග එම අයවළුන්ගේ අවධානයට හා දැනගැනීමට ලක් කල යුතුය. මීට අමතරව ස්ථාවර නියෝගවල සංසෝධනය කිරීම් හා ආදේශන ක්‍රම සියලුම අයවලුන්ගේ දැනගැනීමට ලක්කර අදාල ස්ථාවර නියෝග ඒ අනුව සංසෝධනයන් ආදේශ කිරීමත් කල යුතුයි.

2. පළවන කොටසේ නියෝගඃ

මෙම නියෝග නිකුත් කිරීමේදි රෙජිමේන්තු මධ්‍යස්ථාන, ඒකක අණදෙන නිළධාරි සහ කණ්ඩායම්/බළසෙණ/බතරොයි නිළධාරි අණදෙන වරුන් විසින් වලකරනු ලැබේ. යුධ හමුදාවේ වෙනත් ආයතනවලටද ඔවුන්ගේ අවශ්‍යතාවය පරිදි මෙම නියෝග පලකරනු ලැබේ. මෙසේ පළකරනු ලබන පළවන කොටසේ නියෝගවලට අමතරව විශේෂ නියෝග පළවන කොටස වශයෙන්ද නියෝග පළකරනු ලැබේ. පළකරනු ලබන ස්ථානවල විශේෂයෙන්ම රෙජිමේන්තු මධ්‍යස්ථාන රාජකාරින්, ක්‍රිඩා කටයුතු භාර නිළධාරින්, සෙසු නිළයින්ගේ උසස් කිරීම්/පත් කිරීම් ආදි කරුණු පළවන කොටසේ නියෝගවලට ඇතුලත්ව පලකරනු ලැබේ. ඒකකයන් විසින් පලකරනු ලබන නියෝග අණදෙන නිළධාරි විසින් ප්‍රකාශයට පත් කරන අතර, ඒකක විධායක අධිකාරි විසින් අත්සන් කරනු ලැබේ.

මෙසේ අත්සන් කරනු ලබන නියෝගයන් තම ඒකක නියෝජිතයන් සිටින සෑම ස්ථානයකටම බෙදාහරිනු ලැබේ. මෙම නියෝගයන් පළ කිරිමේදි දිනය, අනු අංකය, ජේදයන් පැහැදිලිව දක්විය යුතුය. ප්‍රකාශයට පත් කරන නිළධාරින්ගේ අනුමැතිය පරිදි මසකට වරක් හෝ ඊට වැඩි වාර ගණනක් වෙනුවෙන් පළකල හැකිය. විශේෂ පළවන කොටසේ නියෝග මගින් පණිවුඩ, සුභාශිංෂන සහ අවමංගල්‍ය කරුනු වෙනුවෙන් පල කරනු ලැබේ.

3. දෙවන කොටසේ නියෝග

මෙම නියෝග පළකරනු ලබන්නේ වැහාලේඅම මගිනුයි. යුධ හමුදාවේ ආයතන හා ඒකක මගින් යුධ හමුදා අයවලුන් වෙනුවෙන් ඔවුන්ගේ වෙනස්වීම් කරුණු වලදී පලකරනු ලබන යුආපාඃ 09 උපයෝගි කර ගනිමින් එමම නියෝග ප්‍රසිද්ධ කරනු ලැබේ. මෙම වෙනස්වීම් ක්‍රියාත්මක වීමේ බළය වශයෙන් මෙම නියෝගය ගණන් ගනු ලැබේ. ඕනෑම සිදුවීමක වලංගුතාවය මත ඇති වන්නේ මෙම නියෝග පලවීමෙන් පසුවයි. ඒ අනුව සියලුම නිළයින් වෙනුවෙන් නඩත්තු කරනු ලබන පුද්ගලික ලිපිගොනුව ක්‍රමවත්ව විධිමත්ව හා නිවැරදිව හා පවත්වා ගැනිමට හැකියාව ඇත. මෙම නියෝග පළ කිරිමේදි නිළධාරි/සෙසුනිළයින් වෙන් වෙන්වද ඒකක වශයෙන් වෙන් වෙන්වද, නිත්‍ය හා ස්වේච්ඡා ඒකක වශයෙන් වෙන් වෙන්වද පලකරනු ලැබේ.

දෙවන කොටසේ නියෝග පළකරන ලද කිසියම් පලකිරිමක් අවලංගු කිරිමට අවශ්‍ය වේ නම් ඒ සඳහා නැවත යුආපා 09 පලකර එම පලකරන ලද යුආපා 09 ද සමග අවලංගු කිරිමට හේතුව විස්තරාත්මකව ලිපියක් මගින් වැහාලේඅම වෙත දැන්විය යුතුයි.